# සභාපති ප්‍රකාශය



එල් බී එෆ් (LBF) ආයතනය ශ්‍රී ලංකාව පුරා වෙසෙන පුද්ගලයන්, ව්‍යාපාර සහ ප්‍රජාවන් සබල ගැන්වීම වෙනුවෙන් දක්වන අඛණ්ඩ කැපවීම තුළින්, රටේ ආර්ථික ප්‍රගතිය සමඟ සැමවිටම ඉතා සමීපව බැඳී සිටියි. මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ විශ්වාසදායී ආයතනයක් ලෙස, මූල්‍ය ඇතුළත් කරගැනීම් (financial inclusion) පුළුල් කිරීම, ව්‍යවසායකත්වය දිරිමත් කිරීම සහ තිරසාර සංවර්ධනයට දායක වන වගකීම්සහගත මූල්‍ය විසඳුම් සඳහා ප්‍රවේශය පහසු කිරීම මඟින් ආර්ථික උන්නතියට සහය වීමේ අපගේ භූමිකාව අපි මැනවින් හඳුනා ගනිමු.

ජී වී ආර් ඩී ප්‍රසන්න | සභාපති


## සභාපතිවරයාගේ ප්‍රකාශය - ඩිජිටල් සංස්කරණ


| ලිඛිත අනුවාදය | | | ශ්‍රව්‍ය අනුවාදය | | |
|---|---|---|---|---|---|
| ඉංග්‍රීසියෙන් DOC 3 | සිංහලෙන් DOC 4 | දෙමළෙන් DOC 5 | ඉංග්‍රීසි PLAY 2 | සිංහල PLAY 3 | දෙමළ PLAY 4 |


### ප්‍රවේශ විය හැකි ආකෘතීන්

වඩාත් පහසු සහ ආකර්ෂණීය අත්දැකීමක් සඳහා, භාෂා ත්‍රිත්වයෙන්ම සමන්විත PDF සහ ශ්‍රව්‍ය (audio) ආකෘතීන් ඔස්සේ මෙම ප්‍රකාශය පරිශීලනය කරන්න. මෙම සම්පත් සැලසුම් කර ඇත්තේ, සැමට සමාන අවස්ථා සැලසීම (inclusivity) සහ ප්‍රවේශ වීමේ පහසුව තහවුරු කරමින්, පුළුල් පරාසයක පිරිසක් වෙත තොරතුරු ලබා දීම සහතික කිරීම සඳහාය.

# සභාපති ප්‍රකාශය




## සභාපතිතුමාගේ ප්‍රකාශය

### ස්ථාවරත්වයේ සිට අවස්ථා දක්වා

ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික තත්ත්වය යහපත් වීම සහ වඩාත් ඉහළ දේශපාලන ස්ථාවරත්වයක් ඇති වීම හේතුවෙන් ව්‍යාපාර සහ පාරිභෝගිකයින් අතර ක්‍රමයෙන් ආත්ම විශ්වාසය ගොඩනැගුණු අතර, ඒ නිසාම 2025/26 මූල්‍ය වර්ෂය මෙරට ආර්ථිකය යළි ගොඩනැගීමේ ගමනේ වැදගත් හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළේය. වසරේ මුල් කාලයේදී පැවති වඩාත් සහයෝගී පොලී අනුපාතය, ණය ඉල්ලුම යළි සක්‍රීය වීමටත්, අංශ ගණනාවක් තුළ පුළුල් ආර්ථික ක්‍රියාකාරකම්වලට සහයෝගය ලබා දීමටත් හේතු විය.

තවත් ක්‍රියාමාර්ග කිහිපයක් මෙම වර්ධන ගමන්මග වේගවත් කළේය. වාහන ආනයනය මත පනවා තිබූ තහනම ඉවත් කිරීම හේතුවෙන් ගමනාගමන ක්ෂේත්‍රයේ අවස්ථා මත ඇති වූ ඉල්ලුම මතු විය. එමෙන්ම ශක්තිමත් ව්‍යාපාරික ශක්තිය, ස්ථාවර ප්‍රේෂණ ගලා ඒම, සංචාරක ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් වර්ධනය වීම සහ යළි ගොඩනැගුණු ආයෝජන විශ්වාසය මගින්, ආර්ථික වර්ධනය අඛණ්ඩව වේගවත් විය. වඩාත් වැදගත් කරුණ නම්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය තවදුරටත් පෙරට ගමන් කිරීමය. එමගින්, සේවා නියුක්තිය, ව්‍යවසායකත්වය සහ ආර්ථික ප්‍රගතිය තුළ එම ක්ෂේත්‍රය සිදුකරන තීරණාත්මක දායකත්වය වඩාත් තහවුරු විය.

ගත වූ මූල්‍ය වර්ෂයේ තුන්වැනි කාර්තුවේ අග භාගයේදී ඇති වූ බරපතළ කාලගුණික තත්ත්ව විසින් මෙරට ආර්ථිකයේ අංශ කිහිපයක තාවකාලික බිඳවැටීම් සිදු වුව ද, පුළුල් දිශානතිය ධනාත්මකව පැවතිණි. සමස්තයක් ලෙස බැලූ විට ගත වූ වසර ස්ථායීකරණයේ සිට අවස්ථා දක්වා සිදු කෙරෙන පැහැදිලි ගමන්මගක් නිරූපණය කළ අතර, එමගින් ව්‍යවසාය, ආයෝජන සහ වර්ධනය සඳහා වඩාත් ශක්තිමත් වේදිකාවක් ගොඩනැගිණි.

### සුවිශේෂී කාර්යසාධනයක්

යහපත් අතට පත්වෙමින් තිබූ මෙම සාර්ව ආර්ථික වාතාවරණය හමුවේ අප සමූහය 2025/26 මූල්‍ය වර්ෂය තුළ විශිෂ්ට කාර්යසාධනයක් වාර්තා කිරීමට සමත් විය. සමූහයේ බදු පෙර ලාභය රු. බිලියන 20.45 ක් ලෙස ද බදු පසු ලාභය රු. බිලියන 14.4 ක් ලෙස ද වාර්තා වූ අතර, එය 2024/25 මූල්‍ය වර්ෂයේදී පිළිවෙලින් රු. බිලියන 16.41 ක් සහ රු. බිලියන 10.86 ක් විය. 2024/25 මූල්‍ය වර්ෂයේදී රු. බිලියන 62.90 ක් ලෙස වාර්තා වූ දළ ආදායම මේ වසරේදී රු. බිලියන 47.16 ක් ලෙස වාර්තා කළේය.

ගත වූ මූල්‍ය වර්ෂය තුළ ශක්තිමත් ව්‍යාපාරික ගමන්මග සහ තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරමින් සමාගම සිය ඉතිහාසයේ ඉහළම බදු පෙර ලාභයවන රු. බිලියන 19.88 ක් වාර්තා කළ අතර එය 22% ක වර්ධනයකි. එමෙන්ම සමාගම බදු පසු ලාභය රු. බිලියන 13.67 ක් ලෙස 27% ක වර්ධනයක් ද, දළ ආදායම රු. බිලියන 60.03 ක් ලෙස 28% ක වර්ධනයක් ද අත්කර ගත්තේය.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ ද්‍රවශීලතා සංචිත යහපත් මට්ටමක පැවති අතර, විනයගරුක ප්‍රතිරක්ෂක ක්‍රියාමාර්ග, දූරදර්ශී ණය අවදානම් කළමනාකරණය සහ දැඩි සේවා අධීක්ෂණය හරහා සමාගමේ වත්කම්වල ගුණාත්මක බව අඛණ්ඩව ශක්තිමත් විය. එය, ක්ෂේත්‍රයේ අඩුම අක්‍රීය ණය අනුපාතය පවත්වා ගැනීමට සමාගමට උපකාරී විය. ක්‍රමෝපායිකව සකස් කළ වත්කම්-වගකීම් කළමනාකරණ, ක්‍රමෝපායික සැලසුම් හරහා සමාගම සිය ආන්තික උපරිමකරණය කිරීමට ක්‍රියාකාරීව කටයුතු කළ අතර, එමගින් ඔරොත්තු දීමේ හැකියාව හෝ දිගුකාලීන ස්ථාවරත්වය අවදානමේ හෙළීමෙන් තොරව ඉහළ කාර්යසාධනයක් අත්කර ගැනීමට හැකි විය.

මෙම කාර්යසාධනය, එල්බී ෆිනෑන්ස් ව්‍යාපාරික ආකෘතියේ ශක්තියත්, ප්‍රමුඛ මූල්‍ය සේවා සමාගමකට අවශ්‍ය විනය, දූරදර්ශී බව සහ අඛණ්ඩතාව පවත්වා ගන්නා අතරම, වෙනස්වන වෙළෙඳපොළ තත්ත්ව මධ්‍යයේ අඛණ්ඩව ශක්තිමත් ප්‍රතිඵල අත්කර ගැනීමට ඇති හැකියාවත් පිළිබිඹු කෙරේ.

### කාර්යසාධනයේ සහ විශ්වාසයේ සම්ප්‍රදාය

ගත වූ මූල්‍ය වර්ෂයේ ජයග්‍රහණ, අඛණ්ඩතාවයෙන්, නොවෙනස් බවේත්, ස්ථිරසාර ආයතනික ශක්තියේත් පුළුල් සම්ප්‍රදාය සමග බැඳී පවතී. වසර ගණනක පටන් එල්බී ෆිනෑන්ස් සමාගම, වෙනස්වන ආර්ථික චක්‍ර තුළ තිරසර කාර්යසාධනයක්, ස්ථාවර වර්ධනයක් සහ ශක්තිමත් මූල්‍ය විනයක් මෙන්ම අගය නිර්මාණය කිරීමේ හැකියාවක් ගොඩනගා ගෙන තිබේ.

## සභාපති ප්‍රකාශය

**ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් පීඑල්සී ( Associated Motor Finance PLC) හි පාලන කොටස් හිමිකාරිත්වයක් අත්පත් කර ගැනීම මගින්, උපායමාර්ගිකව වැදගත් වන වෙළඳපොළ ක්ෂේත්‍රයක් තුළ අපගේ පැවැත්ම ශක්තිමත් කරමින්, ප්‍රවාහන මූල්‍යකරණ ක්ෂේත්‍රය (mobility financing) තුළ අප සතු ස්ථාවරත්වය තවදුරටත් තහවුරු කිරීමට අපට හැකි විය.**

මෙම අඛණ්ඩතාව, අප සමාගම ගොඩනැගී ඇති ශක්තිමත් මූලධර්මවල පදනමයි. දූරදර්ශී පරිපාලනය, මෙහෙයුම් විශිෂ්ටත්වය, පාර්භෝගික විශ්වාසය සහ පැහැදිලි ලෙස ගොඩනගා ඇති දිගුකාලීන දැක්ම විසින් අපගේ ප්‍රගතිය වෙත අපට මගපෙන්වයි.

අප පසුකළ සෑම අවිනිශ්චිත කාල පරිච්ඡේදයක්ම අපට හැඩගැසීමට, ප්‍රතිචාර දැක්වීමට සහ අරමුණු පෙරදැරිව පෙරට ගමන් කිරීමට ඇති හැකියාව ශක්තිමත්කර ඇති අතර, අදවන විට සමාගම හසුරුවන ආයතනික දැනුම සහ ක්‍රමෝපායික චින්තනය හැඩගැස්වීමට හේතු වූයේ එම අභියෝග සමුදායයි. පරම්පරා ගණනක පටන් නොසැලී සිටීමටත්, ගමනේ වේගය ආරක්ෂාකර ගැනීමටත්, වෙළෙඳපොළට අදාළව පැවතීමටත්, නායකත්වය රැක ගැනීමටත් හේතු වූයේ මෙම ශක්තිමත් පදනමයි.

### ජාතික ආර්ථික ප්‍රගතියට දායක වීම

එල්බී ෆිනෑන්ස් යනු, මෙරට සමාජ-ආර්ථික පසුබිමට හොඳින් බැඳී පවතින මූල්‍ය සමාගමකි. ශ්‍රී ලාංකේය මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාග මක් ලෙස අපි, අප කෙරෙහි තබා ඇති වගකීම මනාව හඳුනාගෙන ඇත්තෙමු. එබැවින්, ව්‍යවසාය බලගැන්වීම, මූල්‍ය ප්‍රවේශය පුළුල් කිරීම සහ ප්‍රජාවන් අතර ආර්ථික සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා අපි කැපීපෙනෙන සම්පත් ප්‍රමාණයක් අඛණ්ඩව ආයෝජනය කරමින් සිටිමු.

ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය කෙරෙහි අප දක්වන අඛණ්ඩ අවධානය මගින්, තිරසර වර්ධනය යනු සියලු දෙනා ඇතුළත් සහ පුළුල් පරාසයක් ආවරණය විය යුතු ප්‍රගතියක් බවට අප තුළ ඇති විශ්වාසය නිරූපණය කෙරේ. ව්‍යවසායකත්වය, සේවානියුක්තිය සහ ප්‍රාදේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල වැදගත් කාර්යභාරයක් ඉටුකරන පිරිසක් ලෙස අපි, මෙරට දිගුකාලීන සංවර්ධනය සඳහා එවැනි ක්ෂේත්‍ර ඉතා තීරණාත්මක බව විශ්වාස කරමු. මෙම කැපවීම පිළිබිඹු කරමින්, වඩාත් පුළුල් ප්‍රවේශයක් සහිත මූල්‍යකරණ විසඳුම් හරහා ආර්ථිකයේ අවස්ථා අහිමි අංශවලට නව අවස්ථා විවරකර දෙමින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සහ නැගීඑන ව්‍යවසායකයින් වෙනුවෙන් 'සන්මිත' යෝජනා ක්‍රමය හඳුන්වා දෙන්නේ නිහතමානී ආඩම්බරයෙනි.

මෙරට බැංකු නොවන මූල්‍ය සමාගම් අතර ශාඛා 225 කට අධික විශාලතම ශාඛා ජාලය සහ ශීඝ්‍රයෙන් පුළුල්වන ඩිජිටල් පද්ධතිය හරහා එල්බී ෆිනෑන්ස් සමාගම නාගරික සහ ග්‍රාමීය ප්‍රජාව තුළ පුද්ගලයින්, ව්‍යවසායකයින් සහ ව්‍යාපාර වෙත මූල්‍ය ප්‍රවේශය වඩාත් සමීප කිරීමට අඛණ්ඩව කටයුතු කරයි. මෙම පුළුල් ශාඛා ජාලය තුළින් අප හට ජීවනෝපායට සහයෝගය ලබා දීමටත්, ව්‍යවසාය සවිබල ගැන්වීමටත්, වඩාත් රට පුරා වඩාත් පුළුල් ආර්ථික සහභාගීත්වයක් ප්‍රවර්ධනය කිරීමටත් හැකි වී තිබේ.

බැංකු නොවන මූල්‍ය ආයතන අතර විශාලතම බදු ගෙවන්නා මෙන්ම 5,000 කට අධික පිරිසක් සේවය කරන ආයතනයක් ලෙස අපගේ දායකත්වය මූල්‍ය සේවා පිරිනැමීමට පමණක් සීමා නොවේ. අපි ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමන්මග සමග ගැඹුරින් සම්බන්ධ වෙමින්, සමස්ත සමාජයේ අවස්ථා, සේවානියුක්තිය සහ අන්තර්කරණ වර්ධනය පුළුල් කිරීමට සහයෝගය ලබා දෙන්නෙමු.

### ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම

ගත වූ මූල්‍ය වර්ෂය, එල්බී ෆිනෑන්ස් සමාග මේ ඩිජිටල් පරිවර්තන ගමනේ කැපීපෙනෙන සංධිස්ථානයක් සනිටුහන් කළේය. එම වර්ෂය තුළ අපි, ශීඝ්‍රයෙන් ඩිජිටල්කරණයට ලක්වන සහ අන්තර්-සම්බන්ධ මූල්‍ය ක්ෂේත්‍රය තුළ අපි අඛණ්ඩව අපගේ ස්ථානය ශක්තිමත්කර ගැනීමට කටයුතු කළෙමු.

අපගේ ඩිජිටල් ක්‍රමෝපාය මගින්, ප්‍රවේශය පුළුල් කිරීම, පාර්භෝගික අත්දැකීම වැඩිදියුණු කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සහ දිවයින පුරා සිටින පුද්ගලයින්ගේත්, ව්‍යාපාරවලත් වෙනස්වන මූල්‍ය අවශ්‍යතාවලට සහයෝගය ලබාදිය හැකි පදනම් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කෙරේ. එම පරිවර්තනයේදී LB CIM පහසුකම, සමාගමේ දිගුකාලීන ඩිජිටල් න්‍යායපත්‍රයේ ප්‍රධාන අංගයක් ලෙස, ගත වූ වසර තුළ රු. බිලියන 6 ඉක්මවූ ගනුදෙනු ප්‍රමාණයක් සිදුකර තිබේ.

රට පුරා ඩිජිටල් තාක්ෂණය භාවිතය වේගවත්වන අතර අපි, පාර්භෝගික සබඳතාව සහ සේවා පිරිනැමීම ඉහළ නංවන සහ පුළුල් මූල්‍ය අන්තර්කරණයකට සහයෝගය ලබා දෙන, අනාගතයට ඔබින ඩිජිටල් හැකියාවන් වෙනුවෙන් ආයෝජනය කිරීමට කැපවී සිටිමු. මූල්‍ය විසඳුම්, ජීවන ශෛලීය සේවා සහ පාර්භෝගික අත්දැකීම් එකම පද්ධතියක් හරහා බාධාවකින් තොරව සම්බන්ධ කරන ඩිජිටල් පද්ධතියක් ගොඩනැගීම අපගේ අනාගත ඉලක්කයයි.

### නැවුම් ඉසව් වෙත

ගත වූ වසර තුළ එල්බී ෆිනෑන්ස් සමාගම, සිය මීළඟ වර්ධන අදියර තීරණය කෙරෙන සුවිශේෂී පියවර කිහිපයක් තැබුවේය. ඉලක්කගත ආයෝජන සහ සමීප හා නැගී එන ක්ෂේත්‍ර වෙත මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම හරහා අපි, වෙනස්වන පාර්භෝගික අවශ්‍යතා ඉටු කිරීමට සහ නව අගය මූලාශ්‍ර ග්‍රහණයකර ගැනීමට වඩාත් පුළුල්, අනාගතයට සූදානම් ව්‍යාපාරයක් ගොඩනැගීමට අඛණ්ඩව කටයුතු කරමු.

එම වසර තුළ අපි, Associated Motor Finance සමාගමේ පාලන කොටස් හිමිකාරිත්වය ලබා ගැනීම තුළින් ගමනාගමන මූල්‍යයන සේවා අංශය තුළ අපගේ ස්ථානය තවත් ශක්තිමත්කර ගැනීමට කටයුතු කළෙමු.

තවද අපි, ජාතික ආර්ථික ප්‍රමුඛතා සහ දිගුකාලීන වෙළෙඳපොළ අවස්ථාවලට අනුකූලවන පරිදි පාර්භෝගිකයාට දැරිය හැකි නිවාස, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සඳහා මූල්‍ය සහයෝගය, විදුලි රථවාහන සහ බලශක්ති-කාර්යක්ෂම මූල්‍යයන විසඳුම් ඇතුළු නැගී එන වර්ධන අංශ තුළ අපගේ මෙහෙයුම් කටයුතු පුළුල් කිරීමට ද සමත් වීමු. කලාපය වෙතට අපගේ නාමය ගෙන යාමේ අරමුණ පිළිබිඹු කරමින් අප සමාගම

# සභාපති ප්‍රකාශය

පිලිපීනයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් ආයෝජනයක් සිදුකර තිබේ. ක්ෂුද්‍ර මූල්‍යයන සේවා සහ රථවාහන මූල්‍ය විසඳුම් කෙරෙහි අවධානය යොමු කරමින් එහි මෙහෙයුම් කටයුතු එළඹෙන මූල්‍ය වර්ෂය තුළ ආරම්භ කිරීමට නියමිතය.

## අනාගතයට සූදානම් ආයතනයක් ගොඩනැගීම

මූල්‍ය කාර්යසාධනය සහ වෙළෙඳපොළ පුළුල් කිරීම ඉක්මවා යමින් අපි, එල්බී ෆිනෑන්ස් සමාගමට විනය, ජවය සහ අඛණ්ඩතාව සමගින් කටයුතු කිරීමට හැකිවන ව්‍යූහ, ක්‍රියාවලි සහ ආයතනික ආකෘති ශක්තිමත් කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දුන්නෙමු.

පරිපාලනය, අවදානම් කළමනාකරණය, සයිබර් ආරක්ෂණය, ගනුදෙනු අධීක්ෂණය සහ දත්ත පරිපාලනය යන අංශ තුළ අප සිදු කළ වැඩිදියුණු කිරීම් මගින් වගකීම්සහගත ව්‍යාපාරයක් වෙනුවෙන් අප දක්වන කැපවීම මනාව පිළිබිඹු කෙරේ. එමගින්, ශක්තිමත් අධීක්ෂණ සහ ආයතනික සුපිළිපන්න භාවය විසින් සමාගමේ වර්ධනයට සහයෝගය හිමිවන බවට තහවුරු කෙරේ.

පුළුල් වගවීම, වැඩිදියුණු කළ පාරිසරික කළමනාකරණ ක්‍රියාමාර්ග සහ තිරසර මූල්‍ය සේවා කෙරෙහි දක්වන අවධානය ඉහළ නැංවීම හරහා අපගේ පාරිසරික සහ දේශගුණික න්‍යායපත්‍රය ශක්තිමත් කරන අතර තිරසාරත්වය අපගේ දිගුකාලීන ක්‍රමෝපාය තුළ ප්‍රධානතම අංගයක් බවට පත් විය.

එමෙන්ම, අපගේ කණ්ඩායමේ කැපවීම, හැකියාව සහ උනන්දුව සමාගමේ දිගුකාලීන සාර්ථකත්වයේ පදනම බව හඳුනා ගනිමින් අපි කුසලතාපූර්ණ කාර්යමණ්ඩල සාමාජිකයින් අප සමඟ රඳවා ගැනීමත්, නායකත්වය ගොඩනැගීමටත්, අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලියත් සඳහා අඛණ්ඩව ආයෝජනය කළෙමු.

## ඉදිරි ගමන

අප මීළඟ මූල්‍ය වර්ෂයට පා තබන්නේ ශක්තිමත් පදනමක් සහිතවය. අපගේ ශක්තිමත් ශේෂ පත්‍රය, විශ්වසනීය සන්නාමය සහ මනාව විදහා දක්වා ඇති තීරණය ක්‍රියාත්මක කිරීමේ හැකියාව මගින් විනයක් සහිතව අවස්ථා හඹා යාමට ආත්ම විශ්වාසය ලබා දෙන අතරම, යහපත්වන ආර්ථික මූලධර්ම, ශක්තිමත් ව්‍යාපාරික ක්‍රියාකාරම් සහ ඉහළ යන ඩිජිටල් තාක්ෂණ භාවිතය මගින් අපට ව්‍යාපාරික කටයුතු පුළුල්කර ගැනීමට අවශ්‍ය ධනාත්මක පදනමක් හිමි වී තිබේ.

දිනෙන් දින තරගකාරීත්වය වර්ධනයවන මූල්‍ය ක්ෂේත්‍රය තුළ පෙරට යන අතර එල්බී ෆිනෑන්ස් දැක්ම නොවෙනස්ව පවතී. එනම්, දිවයින පුරා පුද්ගලයින්, ව්‍යවසායකයින් සහ ව්‍යාපාරවල මූල්‍ය සේවා වෙනුවෙන් සිහිපත්වන පළමු නාමය බවට ඉදිරියටත් පත් වීමයි.

අපගේ අපේක්ෂාව, මූල්‍ය වර්ධනයට පමණක් සීමා නොවේ. අවස්ථාවලට මග විවරකර දෙමින්, ව්‍යවසායවලට සහයෝගය ලබා දෙමින්, මූල්‍ය අන්තර්කරණය ඉහළ නංවමින් සහ සියලු පාර්ශ්වකරුවන් හට ස්ථිරසාර අගයක් නිර්මාණය කරමින්, පුළුල් ශාඛා ජාලය, තාක්ෂණය සහ සේවා හරහා ජාතික ආර්ථිකයට සහ සමාජයීය ප්‍රගමනයට දායකත්වය ලබාදෙන ආයතනයක් ගොඩනැගීම අපගේ අභිලාෂයයි.

## ස්තුතිය

අපගේ පාරිභෝගිකයින්, කාර්යමණ්ඩල සාමාජිකයින්, නියාමකයින්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ කොටස්හිමියන් අප කෙරෙහි තබා ඇති නොසැලෙන විශ්වාසය සහ ගත වූ වසර තුළ ඔවුන් අප වෙත ලබා දුන් සහයෝගයට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මාගේ හෘදයංගම ස්තූතිය පුද කරමි.

තවද, කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ කාලය තුළ පෙන්නුම් කළ අසමසම දායකත්වය, නායකත්වය සහ කැපවීම වෙනුවෙන් සුමිත් ආදිහෙට්ටි මහතාට ද අපගේ අවංක ස්තූතිය හිමි විය යුතුය. ඔහුගේ මගපෙන්වීම සහ කැපවීම, අප ආයතනය ශක්තිමත් කිරීමටත්, දිගුකාලීන දිශානතිය හැඩගැස්වීමටත් කැපීපෙනෙන දායකත්වයක් ලබා දුන්නේය.

එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩලයට එක්වන මහාචාර්ය එන්. කේ. ද සොයිසා මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉතා සාදරයෙන් පිළිගන්නා අතර, අප සමාගම වර්ධනයේ සහ පරිවර්තනයේ මීළඟ අදියරට පා තබන මොහොතේදී ඔහුගේ අගනා අදහස් සහ දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කරමි.

ගත වූ වසර තුළ සුවිශේෂී කාර්යසාධනයක් වාර්තා කිරීමට කැපවීමෙන්, නොසැලෙන ගුණයෙන් සහ උනන්දුවෙන් දායකත්වය ලබා දුන් කළමනාකරණ කණ්ඩායමේ සහ එල්බී ෆිනෑන්ස් සෑම සාමාජිකයෙකුටම මාගේ කෘතඥතාව පළකර සිටිමි. තවද, අඛණ්ඩව මගපෙන්වීම, උපදෙස් ලබාදීම සහ නායකත්වය ලබාදීම වෙනුවෙන් මාගේ සහෝදර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් ද ස්තූතිපූර්වකව සිහිපත් කරමි.

ශක්තිමත් පදනමක්, නැවුම් ජවයක් සහ පැහැදිලි ක්‍රමෝපායික සැලසුමක් සමගින් එල්බී ෆිනෑන්ස් සමාගම ආත්ම විශ්වාසයෙන් යුතුව අනාගතයට පිවිසෙයි. විශ්වාසය, කාර්යසාධනය, නොසැලෙන ගුණය සහ වගකීම්සහගත වර්ධනය මත ගොඩනැගුණු සම්ප්‍රදාය පෙරට ගෙන යමින් ආර්ථිකය තුළ අප සතු භූමිකාව තවදුරටත් ශක්තිමත් කිරීම වෙනුවෙන් අපි හෙට දිනයේදී ද කැපවන්නෙමු.

ජී ඩී ආර් ඩී ප්‍රසන්න
සභාපති

29 මැයි 2026